*ජීවිතයේ අග හිඟකම් සදාකාලික නොවේ.....*

*කිසිදා උත්සාහය අත් නොහරින්න.*

## සන්නිවේදනය හා මධ්‍ය අධ්‍යයනය - 12 ශ්‍රේණිය

## 3 පාඩම - මූලික සන්නිවේදන වර්ග, ස්වරූප හා ආකෘති

### I කොටස - සන්නිවේදන වර්ග

**පහත සඳහන් ප්‍රකාශ සඳහා වඩාත් උචිත වන්නේ කුමන සන්නිවේදනය වර්ගය දැයි නම් කරන්න.**

**උදා -** යුධ හමුදාපතිතුමා රටේ වත්මන් ආරක්ෂක තත්ත්වය පිළිබඳව රූපවාහිනී මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයක් නිකුත් කිරීම - **ජන සන්නිවේදනය**

1. උසස් පෙළ විභාගය ආසන්නවත්ම ඔබට දැනෙන මානසික ආතතිය
2. මෙවර සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් සෑම දෙනෙක්ම ජංගම දුරකථන ඔස්සේ තම සමීපතමයන්ට සුභ පැතීම
3. මහල් නිවාසයන්හි ජීවත්වන අයගේ මානසික සුවය වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව සංගීත සංදර්ශන පැවැත්වීම
4. මහජන පරීක්ෂක නිලධාරීන් ගෙන් ගෙට ගොස් වෛරස් ආසාධනය වූවන් නිරෝධායනය කිරීම
5. මුළු රටටම ඇඳිරි නීතිය පනවා ඇති අවස්ථාවක දී රජයේ වෛද්‍ය නිලධාරී සංගමය වසංගතයෙන් සුරක්ෂිත වන ආකාරය පිළිබඳව සමස්ත රටවාසීන් දැනුවත් කිරීම
6. ජනතාව අවදි කිරීම සඳහා නව නිර්මාණ බිහිකිරීම
7. මානසික අවපීඩනය, දරුණු හුදෙකලාව වැනි ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම
8. රජයේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සර්ව පාක්ෂික සමුළුව
9. ශ්‍රව්‍ය දෘශ්‍ය සම්මන්ත්‍රණ ඇමතුම් සිදු කිරීම
10. ජනාධිපතිතුමා ජාතිය ඇමතීම
11. අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව සන්නිවේදනය කිරීමට සුදුසුම සන්නිවේදන වර්ගය
12. වගවීම හා වගකීම මගින් වඩාත් සාර්ථක කරගත හැකි සන්නිවේදනය වර්ගය
13. වඩාත් පහසුවෙන් තම හැඟීම් බෙදා හදා ගතහැකි සන්නිවේදන වර්ගය

Hewavitharana M.V.

14. පරිකල්පන ශක්තිය ප්‍රයෝජනයට ගත හැකි සන්නිවේදන වර්ගය

15. ජාතික සහ ජාත්‍යන්තර ලක්ෂණ වලින් යුතු සන්නිවේදන වර්ගය

16. නිර්වාචික සන්නිවේදනය වඩාත් සාර්ථකව භාවිත කළ හැකි සන්නිවේදන වර්ගය

17. පුද්ගල නිර්මාණශීලීත්වය බෙදා හදා ගත හැකි සන්නිවේදන වර්ගය

18. සියදිවි නසා ගැනීමට තැත් කළ පුද්ගලයෙකු යළි යථා තත්ත්වයට පත්කිරීමට සුදුසුම සන්නිවේදනය

19. සෑම විටම පාහේ එක් දිශාවකට පමණක් සංදේශ ගමන් කරන සන්නිවේදනය

20. ගම්මඩු ශාන්තිකර්මයක් පැවැත්වීම

21. ළඟ එන මහ මැතිවරණයේ දී තම ප්‍රතිපත්ති ජනතාව අතරට ගෙනයාමට සුදුසු සන්නිවේදන වර්ගය

22. ප්‍රදීපාගාර උපක්‍රමය මගින් සාර්ථක කරගත හැකි සන්නිවේදන වර්ගය

23. තම පෞද්ගලික ජීවිතයේ විශේෂ අවස්ථා අන් අය හා පහසුවෙන් බෙදා හදා ගත හැකි සන්නිවේදනය

24. ව්‍යාපාරික කටයුතු සාර්ථක කරගැනීමට භාවිත කළ හැකි සන්නිවේදන වර්ගය

25. එක් ප්‍රදේශයක සිටින ජන සමූහයක් කිසියම් අරමුණක් සඳහා පොළඹවා ගත හැකි සන්නිවේදන වර්ගය

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

26. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

27. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

28. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

29. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

30. සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

31. සමූහ සන්නිවේදනය සාර්ථක කරගැනීමට භාවිත කළ හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න.

32. මහජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

33. මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

34. ජන සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

35. ජන සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

36. HUB ආකෘතියේ ඇතුළත් අංග හයක් නම් කරන්න.

37. අතථ්‍ය සන්නිවේදනයේ විශේෂතා හතරක් නම් කරන්න.

38. අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.

Hewavitharana M.V.

39. එක් දිනක් තුළ ඔබ මුහුණ දෙන අන්තර් පුද්ගල සන්නිවේදන අවස්ථා හතරක් නම් කරන්න.

40. ධර්මපාල දිනය සංවිධානය කිරීමේ දී ඔබට සම්බන්ධ විය හැකි සමූහ සන්නිවේදන අවස්ථා හතරක් නම් කරන්න.

41. මහජන සන්නිවේදන අවස්ථාවක ග්‍රාහක ආකර්ෂණය දිනා ගැනීම සඳහා ඔබට භාවිත කළ හැකි සන්නිවේදන උපකරණ හතරක් නම් කරන්න.

42. ඔබට අභිමත එක් ජන මාධ්‍යයක් (රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත) තෝරාගෙන එහි ලක්ෂණ හතරක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 ක ප්‍රශ්නයකට සරිලන ලෙස)

43. තවත් වසර පහකින් ඔබ පාසලේ ආදි ශිෂ්‍යයෙකු / ආදි ශිෂ්‍යාවක ලෙස **ආදි ශිෂ්‍ය හමුවක්** සංවිධානය කිරීමට අත්‍යාවශ්‍ය සන්නිවේදනය යොදා ගන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

## II කොටස - සන්නිවේදන ස්වරූප

**පහත සඳහන් අවස්ථා කුමන සන්නිවේදන වර්ග, කුමන සන්නිවේදන ස්වරූපයන්ට අයත් දැයි පිළිවෙළින් නම් කරන්න.**

**උදා -** පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියේ දී සිසුන් ඇනුම් හරින විට තම පාඩම වෙනස් කළ යුතු බව ගුරුතුමාට සිතිණ.

සමූහ සන්නිවේදනය, වාචික සන්නිවේදනය, අවාචික සන්නිවේදනය, අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

44. ශිෂ්‍ය නායක පදක්කම් පැළඳීමේ උත්සවයේ දී ප්‍රධාන ශිෂ්‍ය නායකයා ලෙස සුපුන් ඉදිරිපත් කළ කථාව තුළින් ඔහුගේ පෞරුෂත්වය මනාව පිළිඹිබු විය.

45. තාක්ෂණ පීඨයේ තෙවැනි මහලේ සුහද කතාබහක නියැලී සිටි තරිඳු සහ ලිදූෂන් දුටු හෂිනි "අද මීඩියා වලට එන්නේ නැද්ද" යි ඔවුන්ගෙන් ඇසුවේ හස්ත සංඥා ඇසුරෙනි.

46. ගුරු දිනය දා සාරියකින් සැරසුණු උත්පලා, පංති කාමර තුළදී ගුරු භූමිකාව මැනැවින් නිරූපණය කළාය.

47. දහතුන් වසරක පාසල් ජීවිතයට සමු දෙන්නට මත්තෙන් ඒ සදාදරණීය මතකයන් රැගෙන යන්නට අප භාවිත කළ සමරු පොත්, ස්මාට් ජංගම දුරකථන හා ගනුදෙනු කරන වත්මන් දරුවන්ගෙන් ගිලිහී ගොස් ඇති බව රමණී මිස් මා හා පැවසුවාය.

48. රෂිනි ගේ විස්ල් හඬ ඇසෙන සෑම අවස්ථාවකදී ම "ගැහැණු ළමයෙකුට උචිත ලෙස හැසිරෙන්න" යි සෂිනි ඇයට අවවාද කළාය.

Hewavitharana M.V.

49. කොරෝනා විසින් ගිලගත් මෙවර අධ්‍යාපන චාරිකා, පාසල නැවත ආරම්භ වූ පසු කෙසේ හෝ යා යුතු යැයි තැන තැන කටකතා ගෙතෙද්දී, ඊට කිසිසේත් අවස්ථාව හිමි නොවන බව දිනමිණ පුවත්පතේ සඳහන්ව තිබිණ.

50. ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථාවන්හි දී ගයනි ගේත් සෙව්වන්දි ගේත් තොර තෝංචියක් නැති කතාබහ, ගුරු සිත පීඩාවට පත් කළාය.

51. මීට දශක ගණනාවකට පෙර ගුවන් විදුලියෙන් ඇසුණු පැරණි ගීයක් සාහිත්‍ය සමිතියේ දී උෂිනි ප්‍රශස්ත ලෙස ගායනා කළාය.

52. බැලූ බැල්මට හෂිනි සහ සෂිනි ස්වරූපයෙන් සමාන වුවද ඔවුන්ගේ සිතුම් පැතුම් සපුරාම වෙනස් බව, සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී පැවැති නිවුන් හමුවේ දී නිවේදිකාව පැවසුවාය.

53. සෙව්වන්දිත්, උත්පලාත්, උෂිනිත් ගයනිත් ස්කයිප් තාක්ෂණය ඔස්සේ මාර්ගගත කතාබහක නියැලෙද්දී රෂිනි හුදෙකලාවම අනාගතය ගැන සිහින මැව්වාය.

54. උදෑසන රැස්වීම ඇමතූ නියෝජ්‍ය විදුහල්පතිතුමා පවසා සිටියේ ගිය වසරේ 100% ක් වූ උසස් පෙළ කලා අංශයේ ප්‍රතිඵල මෙවර ද පාසලට හිමි කරදීම, මෙවර විභාගයට පෙනී සිටින සියලු දූ පුතුන් ගේ යුතුකමක් හා වගකීමක් බවයි.

55. ලිඳූෂන් ගේ නිහඬ ගති පැවතුම් සේම, තරිඳු ගේ අහංකාර බැල්මත්, සුපුන් ගේ සිනාසෙන දෑසත් කෙල්ලන් ගේ සිත් පැහැර ගත් බව ට්විටර් පණිවිඩයක සඳහන්ව තිබිණි.

## III කොටස - සන්නිවේදන ආකෘති (ආකෘති හතර පහතින් දක්වා ඇත.)

**පහත වගුව ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | සංදේශය | B | විකේතිකරය | C | ග්‍රාහකයා |
| D | බාධක | E | සංදේශ අන්තය | F | අර්ථ නිරූපණය |
| G | තොරතුරු මූලාශ්‍රය | H | සන්නිවේදකයා | I | කථකයා |
| J | ආකේතිකරය | K | සංඥා | L | අවස්ථාව |
| M | බලපෑම | N | කථාව | O | මාධ්‍ය |
| P | සම්ප්‍රේෂකය | Q | ප්‍රතිපෝෂණය | | |

56. I සහ N ඇතුළත් සන්නිවේදන ආකෘතිය හඳුන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද?

57. B ට සමාන අංගයක් දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

58. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට අයත් අංග නිරූපණය වන අක්ෂර මොනවා ද?

Hewavitharana M.V.

59. මෙම අංගය සමන්විත වන්නේ සංඥා සහ සංකේත වලිනි. එය දැක්වෙන අක්ෂරය කුමක් ද?

60. ශැනන් හා වීවර් ආකෘතියේ ආරම්භය සහ අවසානය පිළිවෙළින් නිරූපණය වන්නේ කුමන අක්ෂර මගින් ද?

61. ලැස්වෙල් ආකෘතියේ වැඩිම අවධානයට ලක්වූ කරුණ නිරූපණය වන්නේ කුමන අක්ෂරයෙන් ද?

62. ඇරිස්ටෝටල්, ශැනන් හා වීවර්, ලැස්වෙල් ආකෘති තුනම ඒක රේඛීය ආකෘති වන්නේ මෙම ලක්ෂණය නොමැති වීමෙනි. එම අංගය දැක්වෙන අක්ෂරය නම් කරන්න.

63. B විසින් K හරහා J ට යවන පණිවිඩයක්, අසාර්ථක වන්නේ කුමන අක්ෂරය මගින් දැක්වෙන ලක්ෂණයේ බලපෑමෙන් ද?

64. ලැස්වෙල් ආකෘතියට අයත් අංග පිළිවෙළින් දැක්වෙන අක්ෂර මොනවා ද?

65. සන්නිවේදන කාර්යය සන්නිවේදකයා ගෙන් ආරම්භ නොවී වෙනත් ස්ථානයකින් ආරම්භ වන බව දැක්වෙන සන්නිවේදන අකෘතිය කුමක් ද? එම අංගය සඳහන් වන අක්ෂරය නම් කරන්න.

66. විද්‍යුත් සන්නිවේදනයේ දී K සක්‍රිය වීමට නම් මෙම මෙවලම අවශ්‍ය වේ. එම මෙවලම දැක්වෙන අක්ෂරය කුමක් ද?

67. B විසින් J වෙත පෙරළා පණිවිඩයක් එවන්නේ නම් එම ක්‍රියාවලිය දැක්වෙන අක්ෂරය කුමක් ද? එහි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

68. ලැස්වෙල් ආකෘතියේ දැකිය හැකි, එහෙත් ඇරිස්ටෝටල් ආකෘතියේ දැකිය නො හැකි ලක්ෂණයක් පෙන්නුම් කරන්නේ කුමන අක්ෂරය මගින් ද?

69. 13 - කලා පංතියේ සිසු සිසුවියන් දෙව්රම් වෙහෙර වෙත වන්දනා ගමනක් සැලසුම් කළ අතර, එක් ශිෂයෙක් ඊට සහභාගී නොවූයේ විභාගය ආසන්න වූ මොහොතක එවන් ගමන් යෑම කාලය අපතේ හැරීමක් බවට නිගමනය කරමිනි. මෙම අවස්ථාවේ දී සිදුවූයේ කුමක් ද? එම තත්ත්වය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

70. සන්නිවේදන ක්‍රියාවලිය ද්වි මාර්ගික බව පෙන්විය හැකි ලක්ෂණය සඳහන් අක්ෂරය නම් කරන්න.

71. D අක්ෂරයෙන් දැක්වෙන කරුණ පිළිබඳව සන්නිවේදනය ඇසුරෙන් මුලින්ම අර්ථ කථනය කරන ලද්දේ කවුරුන් විසින් ද? එහි වර්ග මොනවාදැයි දක්වා කෙටියෙන් හඳුන්වන්න.

72. සන්නිවේදන ක්‍රියාවලිය යාන්ත්‍රීය පදනමක් මත විග්‍රහ කළ ආකෘතිය කුමක් ද? එහි යාන්ත්‍රික බව සනාථ කිරීම සඳහා ඇතුළත් අංගය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?


Hewavitharana M.V.


73. H විසින් K උපයෝගී කරගෙන සකස් කළ A, C වෙත යවන ලද්දේ P හරහායි. මෙම තත්ත්වය 'Korona Class' WhatsApp group එක සඳහා ආදේශ කරන්න.

74. ඉහත ක්‍රියාවලිය ඒක මාර්ගික ද? ද්වි මාර්ගික ද? ඔබේ පිළිතුරට හේතු, දක්වා ඇති වගුව ඇසුරෙන් පහදන්න.

75. "කෝදුව කෝ" යන්න සුපුන් SMS පණිවිඩයක් මගින් තරිඳු ගෙන් අසා තිබුණේ "කෝ දුව කෝ" ලෙසිනි. තරිඳු ගේ පිළිතුර වූයේ "එයා ගෙදර නෑ" යන්නයි. මෙම සිද්ධිය විග්‍රහ කළ හැකි ඉහත වගුවේ අනුරූප අංග මොනවාද?

**ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය**








**ඇරිස්ටෝටල් ආකෘතිය**




**හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය**

**ෂැනන් හා වීවර් ආකෘතිය**




*"ජයග්‍රහණ...... බන්දේසියක තබා ඔබ වෙත පිළිගන්වන්නේ නැත. සෑම ජයග්‍රහණයක් පිටුපසම ඇත්තේ අනන්ත අප්‍රමාණ වූ කැපකිරීම් ය.*

*දහදියෙන් කඳුලෙන් කළ කැපකිරීමය."*

Hewavitharana M.V.